# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14 577 – 1965 දෙසැම්බර් 4 වැනි සෙනසුරාදා – 1965.12.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### කර්මාන්තශාලා ආඥාපනත

1961 අංක 54 දරණ පනතින් සංශෝධිත, (128 වැනි අධිකාරය වන) කර්මාන්තශාලා ආඥාපනතේ 62 වැනි හා 105 වැනි වගන්තිවලින් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිවරයා විසින් පනවනු ලැබ, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් එකී 105 වන වගන්තිය යටතේ අනුමත කරන ලද නියෝග.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස
ඇමති.

1965 දෙසැම්බර් මස 1 වැනි දින,
කොළඹදී ය.

#### නියෝග

(1) මෙම නියෝග 1965 කර්මාන්තශාලා (අන්තරායදායක සිදුවීම් දැනුම් දීමේ) නියෝග යනුවෙන් හැඳින්විය හැකිය.

(2) කර්මාන්තශාලාවක් තුළ සිදු වන හදිසි අනතුරක් පරීක්ෂක වරයකුට දැනුම් දිය යුතු යයි නියම කර ඇති, කර්මාන්තශාලා ආඥාපනතේ 61 වන වගන්තියේ විධිවිධාන මෙහි වූ I වන උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් සිදුවීම් පංති කෙරෙහි ද ව්‍යාප්ත වී අදාළ විය යුතුය.

(3) ආඥාපනතේ 61 වන සහ 62 වන වගන්ති යටතේ දිය යුතු යයි නියමිත යම් අන්තරායදායක සිදුවීමක් පිළිබඳ දැන්වීම මෙහි වූ II වන උපලේඛනයෙහි දක්වෙන 12 වන ආකෘතියට සාරානුකූල ව විය යුතු අතර ඒ දැන්වීම ඒ සිදුවීමෙන් පසු දින තුනක් ඇතුළත කර්මාන්තශාලාවේ පදිංචිකරු හෝ ඔහුගේ නියෝජිතයන් විසින් ප්‍රාදේශික කර්මාන්තශාලා පරීක්ෂක වෙත හෝ ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක වෙත යැවිය යුතුය.

### I වන උපලේඛනය

**සිදුවීම් පන්ති :**

(1) යාන්ත්‍රික බලයෙන් ක්‍රියා කරන කරකැවෙන භාජනයක්, රෝදයක්, ඇඹරුම් ගලක් හෝ මට්ටම් රෝදයක් පිපිරීම.

(2) දොඹකරයක්, සකස් කළ හැකි අංග සහිත උත්තෝලනයක්, දඹරයක් හෝ මිනිසුන් හෝ භාණ්ඩ එසවීම සඳහා හෝ එසවීමේ කොටසක් වශයෙන් පාවිච්චි කරනු ලබන වෙනත් උපකරණයක් (දම්වැල හෝ කඹය කැඩී යෑම හැර) පෙරළීම හෝ ක්‍රියා විරහිත වීම හෝ දොඹකරයක් පෙරළීම.

(3) පුද්ගලයන් සේවයෙහි යොදවා ඇති යම් කාමරයක හෝ ස්ථානයක නිර්මානයට හෝ එහි ඇති යන්ත්‍රවලට, යන්ත්‍රෝපකරණවලට හෝ උපකරණවලට සහ ද්‍රව්‍යවලට හානි සිදු වන පිපිරීමක් හෝ ගින්නක් ඇති වී එහි විපාක වශයෙන් ඒ කාමරයේ හෝ ස්ථානයේ සාමාන්‍ය වැඩ හෝ යන්ත්‍ර හෝ යන්ත්‍රෝපකරණ ඒ පිපිරීම හෝ ගින්න—

(i) ගෑස් ධූලි හෝ වාෂ්ප ගිණි ගැනීම නිසා, හෝ

(ii) සැලොලයිඩ් හෝ සම්පූර්ණයෙන් හෝ කොටසක් සැලොලයිඩ් වලින් සාදන ලද ද්‍රව්‍ය ගිණි ගැනීම නිසා

සිදුවූ අවස්ථාවක, පැය 5 ට නො අඩු කාලයක් තුළ නවතා තැබීමට සිදුවීම.

(4) පිපිරීමෙන් හෝ ගිණි ගැනීමෙන් හෝ යන්ත්‍රවල නිර්මානයට හානි සිදුවීමෙන් පැය 5 ට නො අඩු කාලයක් තුළ ඒවා නවතා තැබීමට හෝ පාවිච්චියට නො ගැනීමට සිදුවන පරිදි ඇති වන විදුලි බලය කාන්දු වීම හෝ විදුලි යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ ක්‍රියා විරහිත වීම.

(5) පුද්ගලයන් සේවයෙහි යොදවා ඇති යම් කාමරයකට බලපාන ලෙස සහ පැය 24 ට නො අඩු කාලයක් තුළ එහි සාමාන්‍ය වැඩ සම්පූර්ණයෙන් අත් සිටුවීමට සිදුවන පරිදි ඇති වන පිපිරීම හෝ ගිණි ගැනීම.

(6) (වාතය ඇතුලු) යම් ගෑස් හෝ ගෑස් වර්ග හෝ වාෂ්ප හෝ යම් ද්‍රව හෝ ද්‍රව්‍ය වායු ගෝලයේ පීඩනයට වඩා වැඩි පීඩනයක් සහිත ව ගබඩා කිරීම සඳහා පාවිච්චි කරනු ලබන ග්‍රාහකයක් හෝ භාජනයක් වායු පීඩනයේ ප්‍රතිඵලයක් වශයෙන් පිපිරීම.

(7) (128 වන අධිකාරය වන) කර්මාන්තශාලා ආඥාපනතේ 34 (14) වන වගන්තියෙහි නිරූපනය කර ඇති ලෙස වාෂ්ප බොයිලේරුවක් හෝ යම් වාෂ්ප නලයක් හෝ පෝෂක නලයක් පිපිරීම.

(8) බිම් තට්ටුවක්, අට්ටාල පියස්සක්, සේතුවක්, උමගක්, දුම් කවුලුවක්, බිත්තියක් හෝ කර්මාන්තශාලාවක ගොඩනැගිල්ලක් වූ හෝ කර්මාන්තශාලාවක මිදුල හෝ අවට භූමිය ඇතුළත වූ යම් ගොඩනැගිල්ලක් කඩා වැටීම හෝ කිඳා බැසීම.

### II වන උපලේඛනය

#### 12 වන ආකෘතිය

(128 වන අධිකාරය වන) කර්මාන්තශාලා ආඥාපනත

#### 61 වන වගන්තිය සමග කියවිය යුතු 62 (1) වන වගන්තිය යටතේ අන්තරායදායක සිදුවීම් දැනුම්දීම

(1) කර්මාන්තශාලාවේ පදිංචිකරු :—
  (අ) නම :————.
  (ආ) ලිපිනය :————.
  (ඇ) කර්මාන්තය :————.

(2) අන්තරායදායක සිදුවීම වූ ස්ථානය :—
  (i) ලිපිනය : (ඉහත සඳහන් 1 ට වඩා වෙනස් නම්)
  (ii) නියම ස්ථානය :————.
  (iii) එහි කෙරෙන වැඩෙහි ස්වභාවය :————.

(3) අන්තරායදායක සිදුවීම :—
  (අ) දිනය හා වේලාව :————.
  (ආ) අන්තරායදායක සිදුවීම වූයේ කෙසේ ද යන්න පිළිබඳ සම්පූර්ණ විස්තරය :————.
  (අවශ්‍ය නම් අනෙක් පිටට ද ගෙන යන්න)

(4) අන්තරායදායක සිදුවීම සාමාන්‍ය ලේඛනයෙහි සටහන් කොට තිබේ ද යන්න :————.

————,
පදිංචිකරුගේ හෝ නියෝජිතයන්ගේ
අත්සන.

දිනය :————.

12-434/1

(උ) චාප ගිනියම් කර පෑස්සීම ඔක්සි ඇසිට්වලින් ගිනියම් කර පෑස්සීම ගිනි උදුන් වැඩ හෝ ඇස් ප්‍රබල දීප්තියට සහ උග්‍ර රශ්මියෙන් යුත් විකිරණයන්ට භාජන වන කටයුතුවල පුද්ගලයන් සේවයෙහි යොදවන වෙනත් ක්‍රියා.

(ඌ) මිනිස් ඇසට අනතුරු පීඩා පැමිණ විය හැකි වෙන යම් ක්‍රියා හෝ කටයුතු.

12-434/5

## කර්මාන්තශාලා ආඥපනත

1961 අංක 54 දරණ පනතින් සංශෝධිත, (128 වැනි අධිකාරය වන) කර්මාන්තශාලා ආඥපනතේ 105 වැනි වගන්තිවලින්, තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති වරයා විසින් පනවනු ලැබ උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් එකී 105 වන වගන්තිය යටතේ අනුමත කරනු ලැබූ නියෝග.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

1965 දෙසැම්බර් 1 වැනි දින,
කොළඹ දීය.

### නියෝග

1. මෙම නියෝග 1965 කර්මාන්තශාලා (කෑම කන කාමර) නියෝග යනුවෙන් හැඳින්විය හැකිය.

2. කර්මාන්තශාලාවක පස් දෙනෙකුට නො අඩු ගණනක් සේවයේ යොදවා ඇති විට, කර්මාන්තශාලාවේ පදිංචිකරු විසින්, මෙහි උප ලේඛනයෙහි දක්වෙන අවශ්‍යතාවයන් අනුව සුදුසු ඉඩකඩ ඇති වෙනම කෑම කන කාමර කම්කරුවන්ට කෑම ගැනීම සඳහා ඇතිකර නඩත්තු කළ යුතුය.

3. කෑම කන කාමර ස්ථිර ලෙස ගොඩනගා තිබිය යුතු අතර, වැඩ කරන කාමරවල සිට පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානයක විය යුතුය. පොළොව වතුර උරා නොගන්නා පහසුවෙන් සේදිය හැකි ද්‍රව්‍යයන් ගෙන් ගොඩනැගිය යුතුය.

4. කෑම කන කාමර සියලුම කාලගුණයන්ගෙන් සෑහෙන ලෙස ආරක්ෂාව සලසන ආකාරයට විය යුතුය.

5. කෑම කන කාමරවලට ප්‍රමාණවත් ලෙස වාතය හා ආලෝකය ලැබෙන සේ සැලැස්විය යුතුය.

6. කෑම කන කාමර සඳහා මේස, පුටු හෝ බංකු සෑහෙන ප්‍රමාණයක් තිබිය යුතුය.

7. සෑම කෑම කන කාමරයකටම බොන වතුර සැපයිය යුතුය. පයිප්ප වතුර ලබාගත නොහැකි විට, සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් "බොන වතුර" යනුවෙන් පැහැදිලිව සඳහන් සුදුසු භාජනවල වතුර සැපයිය යුතුය.

8. සෑම කෑම කන කාමරයකම වතුර උඩට විදින වර්ගයේ කරාම ඇති තැන්වල හැර සේදීමේ පහසුකම් ද සහිතව කෝප්ප හෝ බොන භාජන සැපයිය යුතුය.

9. සෑම කෑම කාමරයකට අනවශ්‍ය වතුර බැසයාමට සුදුසු වතුර බැස්වීමේ ක්‍රම සැලැස්විය යුතුය.

10. සෑම කෑම කාමරයක්ම නිතරම පිරිසිදුව තබාගත යුතුය.

11. සෑම කෑම කාමරයකම කුණු දැමීමට පියන් සහිත කුණු බාල්දි හෝ වෙනත් භාජන තැබිය යුතුය.

12. සෑම කෑම කාමරයකම කුණු බාල්දි හෝ භාජන දවසකට සැරයක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනක් හෝ ඉවත් කිරීම හා පිරිසිදු කිරීම සඳහා සෑහෙන සේවයක් සැලසිය යුතුය.

13 කෑම කාමරය කර්මාන්තශාලාවේ පදිංචිකරු විසින් පත් කරන ලද වගකිව යුතු පුද්ගලයෙකු භාරේ තැබිය යුතුය.

14. සෑම කෑම කන කාමරයකම බිත්ති, සීලිං සහ වෙන් කිරීමේ බිත්ති මාස 12කට වතාවක් සේදීම හෝ ඒවායේ සුදු හුණු ගෑම, පාට වර්ග ගෑම හෝ සායම් ගෑම කළ යුතුය. සායම් ගාන ලද තැන්වල නැවත සායම් ගෑමේ කාල සීමාව ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂකගේ හෝ දිස්ත්‍රික්ක කර්මාන්තශාලා පරීක්ෂකගේ මතය අනුව වෙනස් කළ හැකිය.

15. සේදීමේ, සුදු හුණු ගෑමේ, පාට වර්ග ගෑමේ හෝ සායම් ගෑමේ දින පිළිබඳ වාර්තා 1961 ජූනි 23 හා අංක 12,494 දරණ ගැසට් අතිරේකයෙහි පළ කරන ලද 1960 කර්මාන්තශාලා (අංක 1) නියෝගවල උපලේඛනයෙහි දක්වා ඇති ආකෘති පත්‍රයේ සටහන් කළ යුතුය.

### උපලේඛනය

1. කෑම කාමරය ඕනෑම වේලාවක එක් වරකට කම්කරුවන්ගෙන් සියයට 30කට වත් කෑම කෑමට ඉඩ තිබිය යුතුය.

එසේ වුවද, විශේෂ කර්මාන්තශාලාවක හෝ විශේෂ පංතියක හෝ විස්තරයකට අයත් වන කර්මාන්තශාලාවක ඒ සියෙට ප්‍රමාණය ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක විසින් හෝ ප්‍රාදේශීය කර්මාන්තශාලා පරීක්ෂක විසින් ලිඛිත සහතිකයකින් වෙනස් කළ හැකිය.

2. මේස සහ පුටු හෝ බංකු හැර උපකරණ, සවිකර ඇති දේ පහසුකම් හා ලී බඩු සඳහා ඉඩකඩ අතහැර ගත් විට එක් තැනැත්තකු සඳහා වර්ග අඩි 10කට නො අඩු බිම් ප්‍රමාණයක් කෑම කාමරයේ තිබිය යුතුය.

12-434/6

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.